බුදුසරණ

2015 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

දුරුතු මස පෝය													
ජන 04	ඉරිදා	පූ.භා.	9.23	න්	පසළොස්වක ලබා	05	සඳුදා	පූ.භා.	10.23	න්	ගෙවේ	04	ඉරිදා සිල්
ජන 13	අඟහ.	පූ.භා.	2.17	න්	අව අටවක ලබා	14	බදාදා	පූ.භා.	4.06	න්	ගෙවේ	13	අඟහ. සිල්
ජන 19	සඳුදා	අ.භා.	9.59	න්	අමාවක ලබා	20	අඟහ.	අ.භා.	6.44	න්	ගෙවේ	20	අඟහ. සිල්
නවම් මස පෝය													
ජන 26	සඳුදා	අ.භා.	10.52	න්	පුර අටවක ලබා	27	අඟහ.	අ.භා.	9.53	න්	ගෙවේ.	27	අඟහ. සිල්
පෙබ 03	අඟහ.	පූ.භා.	2.32	න්	පසළොස්වක ලබා	04	බදාදා	පූ.භා.	4.39	න්	ගෙවේ.	03	අඟහ. සිල්
පෙබ 11	බදාදා	අ.භා.	8.54	න්	අව අටවක ලබා	12	බ්‍රහස්	අ.භා.	9.33	න්	ගෙවේ.	12	බ්‍රහස් .සිල්
පෙබ 18	බදාදා	පූ.භා.	9.03	න්	අමාවක ලබා	19	බ්‍රහස්	පූ.භා.	5.17	න්	ගෙවේ.	18	බදාදා සිල්
මැදින් මස පෝය													
පෙබ 25	බදාදා	පූ.භා.	10.54	න්	පුරඅටවක ලබා	26	බ්‍රහස්.	පූ.භා.	10.44	න්	ගෙවේ.	25	බදාදා සිල්.
මාර්. 04	බදාදා	අ.භා.	8.58	න්	පසළොස්වක ලබා	05	බ්‍රහස්	අ.භා.	11.35	න්	ගෙවේ.	05	බ්‍රහස් සිල්
මාර් 13	සිකුරා.	පූ.භා.	11.29	න්	අව අටවක ලබා	14	සෙන.	පූ.භාශ.	10.56	න්	ගෙවේ.	13	සිකුරා සිල්
මාර් 19	බ්‍රහස්.	අ.භා.	6.48	න්	අමාවක ලබා	20	සිකුරා	අ.භා.	3.06	න්	ගෙවේ.	20	සිකුරා සිල්
බක් මස පෝය													
මාර්. 27	සිකුරා	පූ.භා.	0.54	න්	පුරඅටවක ලබා	28	සෙන	පූ.භා.	1.42	න්	ගෙවේ	27	සිකුරා සිල්
අප්‍රේ 03	සිකුරා	අ.භා.	3.18	න්	පසළොස්වක ලබා	04	සෙන.	අ.භා.	05.35	න්	ගෙවේ	03	සිකුරා සිල්
අප්‍රේ 11	සෙන	අ.භා.	9.54	න්	අව අටවක ලබා	12	ඉරිද.	අ.භා.	08.26	න්	ගෙවේ	12	ඉරිදා සිල්
අප්‍රේ 18	සෙන	පූ.භා.	3.37	න්	අමාවක ලබා	19	ඉරිදා	පූ.භා.	0.27	න්	ගෙවේ.	18	සෙන සිල්
වෙසක් මස පෝය													
අප්‍රේ 25	සෙන.	අ.භා.	4.38	න්	පුරඅටවක ලබා	26	ඉරිද.	අ.භා.	06.22	න්	ගෙවේ	25	සෙන සිල්
මැයි 03	ඉරිදා	පූ.භා.	7.59	න්	පසළොස්වක ලබා	04	සඳුදා	පූ.භා.	9.12	න්	ගෙවේ	03	ඉරිදා සිල්
මැයි 11	සඳුදා	පූ.භා.	5.04	න්	අවඅටවක ලබා	12	අඟහ.	පූ.භා.	03.05	න්	ගෙවේ	11	සඳුදා සිල්
මැයි 17	ඉරිදා	දිවා	12.00	න්	අමාවක ලබා	18	සඳුදා	පූ.භා.	9.43	න්	ගෙවේ	17	ඉරිදා සිල්
පොසොන් මස පෝය													
මැයි 25	සඳුදා	පූ.භා.	9.39	න්	පුරඅටවක ලබා	26	අඟහ.	අ.භා.	12.02	න්	ගෙවේ	25	සඳුදා සිල්
ජූනි 01	සඳුදා	අ.භා.	10.04	න්	පසළොස්වක ලබා	02	අඟහ.	අ.භා.	9.49	න්	ගෙවේ	02	අඟහ සිල්
ජූනි 09	අඟ.	පූ.භා.	10.16	න්	අව අටවක ලබා	10	බදාදා	පූ.භා.	08.07	න්	ගෙවේ	09	අඟහ. සිල්
ජූනි 15	සඳුදා	අ.භා.	8.41	න්	අමාවක ලබා	16	අඟහ.	අ.භා.	7.35	න්	ගෙවේ	16	අඟහ සිල්
අඩ් ඇසළ මස පෝය													
ජූනි 24	බදාදා	පූ.භා.	3.16	න්	පුරඅටවක ලබා	25	බ්‍රහස්.	පූ.භා.	5.46	න්	ගෙවේ	24	බදාදා සිල්
ජූලි 01	බදාදා	පූ.භා.	9.30	න්	පසළොස්වක ලබා	02	බ්‍රහස්	පූ.භා.	7.49	න්	ගෙවේ	01	බදාදා සිල්
ජූලි 08	බදාදා	අ.භා.	2.56	න්	අව අටවක ලබා	09	බ්‍රහස්	අ.භා.	12.55	න්	ගෙවේ	08	බදාදා සිල්
ජූලි 15	බදාදා	පූ.භා.	6.39	න්	අමාවක ලබා	16	බ්‍රහස්.	පූ.භා.	6.54	න්	ගෙවේ	15	බදාදා සිල්
ඇසළ මස පෝය													
ජූලි 23	බ්‍රහස්.	අ.භා.	8.30	න්	පුරඅටවක ලබා	24	සිකුරා.	අ.භා.	10.29	න්	ගෙවේ	24	සිකුරා සිල්
ජූලි 30	බ්‍රහස්.	අ.භා.	7.01	න්	පසළොස්වක ලබා	31	සිකුරා	අ.භා.	4.13	න්	ගෙවේ	31	සිකුරා සිල්
අගෝ. 06	බ්‍රහස්.	අ.භා.	8.24	න්	අවඅටවක ලබා	07	සිකුරා	අ.භා.	6.48	න්	ගෙවේ	07	සිකුරා සිල්
අගෝ 13	බ්‍රහස්	අ.භා.	6.49	න්	අමාවක ලබා	14	සිකුරා.	අ.භා.	8.23	න්	ගෙවේ	14	සිකුරා සිල්
නිකිණි මස පෝය													
අගෝ. 22	සෙනසු.	දිවා	12.24	න්	පුරඅටවක ලබා	23	ඉරිද	අ.භා.	1.26	න්	ගෙවේ	22	සෙනසු සිල්
අගෝ. 29	සෙනසු.	පූ.භා.	03.35	න්	පසළොස්වක ලබා	30	ඉරිදා	පූ.භා.	0.05	න්	ගෙවේ	29	සෙනසු සිල්
සැප් 05	සෙනසු	පූ.භා.	03.56	න්	අවඅටවක ලබා	06	ඉරිද	පූ.භා.	03.02	න්	ගෙවේ	05	සෙනසු සිල්
සැප් 12	සෙනසු	පූ.භා.	09.43	න්	අමාවක ලබා	13	ඉරිදා	දිවා	12.11	න්	ගෙවේ	12	සෙනසු සිල්
බිනර මස පෝය													
සැප් 21	සඳුදා	පූ.භා.	02.23	න්	පුරඅටවක ලබා	22	අඟහ.	පූ.භා.	2.23	න්	ගෙවේ	21	සඳුදා සිල්
සැප් 27	ඉරිදා	දිවා	12.06	න්	පසළොස්වක ලබා	28	සඳුදා	පූ.භා.	8.20	න්	ගෙවේ	27	ඉරිදා සිල්
ඔක් 04	ඉරිදා	අ.භා.	2.38	න්	අවඅටවක ලබා	05	සඳුදා.	අ.භා.	2.45	න්	ගෙවේ	04	ඉරිදා සිල්
ඔක් 12	සඳුදා	පූ.භා.	2.58	න්	අමාවක ලබා	13	අඟහ.	පූ.භා.	5.36	න්	ගෙවේ	12	සඳුදා සිල්
වප් මස පෝය													
ඔක් 20	අඟහ.	අ.භා.	2.23	න්	පුර අටවක ලබා	21	බදාදා	අ.භා.	1.30	න්	ගෙවේ	20	අඟහ. සිල්
ඔක් 26	සඳුදා	අ.භා.	9.10	න්	පසළොස්වක ලබා	27	අඟහ.	අ.භා.	5.35	න්	ගෙවේ	27	අඟහ. සිල්
නොවැ 03	අඟහ.	පූ.භා.	5.20	න්	අව අටවක ලබා	04	බදාදා	පූ.භා.	6.38	න්	ගෙවේ	03	අඟහ. සිල්
නොවැ 10	අඟහ.	අ.භා.	9.23	න්	අමාවක ලබා	11	බදාදා	අ.භා.	11.17	න්	ගෙවේ	11	බදාදා සිල්
ඉල් මස පෝය													
නොවැම් 19	බ්‍රහස්.	පූ.භා.	0.39	න්	පුර අටවක ලබා	19	බ්‍රහස්.	අ.භා.	11.09	න්	ගෙවේ	19	බ්‍රහස් සිල්
නොවැ 25	බදාදා	පූ.භා.	7.09	න්	පසළොස්වක ලබා	26	බ්‍රහස්	පූ.භා.	4.14	න්	ගෙවේ	25	බදාදා සිල්
දෙසැ 03	බ්‍රහස්	පූ.භා.	0.04	න්	අවඅටවක ලබා	04	සිකුරා	පූ.භා.	2.23	න්	ගෙවේ	03	බ්‍රහස්. සිල්
දෙසැ 10	බ්‍රහස්.	අ.භා.	3.24	න්	අමාවක ලබා	11	සිකුරා	අ.භා.	3.59	න්	ගෙවේ	10	බ්‍රහස් සිල්
උඳුවප් මස පෝය													
දෙසැ 18	සිකුරා	පූ.භා.	9.39	න්	පුරඅටවක ලබා	19	සෙන.	පූ.භා.	7.47	න්	ගෙවේ	18	සිකුරා සිල්
දෙසැ 24	බ්‍රහස්	අ.භා.	6.27	න්	පසළොස්වක ලබා	25	සිකුරා	අ.භා.	4.41	න්	ගෙවේ	24	බ්‍රහස් සිල්

දෙළොස් මහා පොහොය දිනවල සිදුවූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සවිවන් සඳහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදාළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම් තැන්තේ මහවැලි ගඟ අසබඩ මිහිපේ තම් සරුදනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුනු පොහෝ දිනකය.

මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත් පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදකය.

බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින දෙවැනි වරට ද බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද දහම් අමා මිහිරෙන් තොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද, බක් පුර පොහෝ දිනකදී ය.

වෙසක් පසළොස්වක පොහොය

තිලොවඟ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවිඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොත් දිනයයි.

දෙළොස් මහා පොහොය දිනවල සිදුවූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

ඇසළ පසළොස්වක පොහොය.

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත්, නිවනත්, එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනයයි, ඇසළ පෝද.

නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පැළවිය ද හික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයයි. නිකිණි පසළොස්වක පොහෝදා පොහොය කොට නිකිණි අව පැළවිය ද පසුවස් එළඹීමයි සසුන් පිළිවෙත වන්නේ.

බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව හික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වැඩ වසමින් බණ භාවනාවල යෙදෙමින් ස්වකීය ශාසන පරමාර්ථ ඉටු කරගන්නා කාලයකි. මෙහෙණ සසුනේ ආරම්භය සිදු විය.

වප් පසළොස්වක පොහොය

වස්සාන සෘතුවේ මුල් තුන් මස හික්ෂූන් වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කෙරේ.

ඉල් පසළොස්වක පොහොය

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම පසුවස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කෙරෙන්නේ ඉල් පෝදා ය.

උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදු වූ ශ්‍රී සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ ලංකා ගමනය ගැන ලංකා මෙහෙණ සසුන ගැන, ජය ශ්‍රී මහා බෝ සම්බුන් ගැන සිහි කරන කවර අයකුට වුවද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

බැතිබර දායකත්වය

සිඩාලේප

සෑම ගෙදරකම සිටිය යුතු වෙද මහත්මයා

වෂී 2015 ක්වූ ජනවාරි 04 වනදා ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.